කතුවැකිය

විදුරාවට පනහයි !

වසර 50 ක් යනු සුළු පටු කාලයක් නොවේ. එතරම් සුවිශාල කාලයක් ඔබ හා සමඟ විද්‍යාත්මක සංවාදයක යෙදීමට "විදුරාව" ලද භාග්‍යය සිහිපත් කරන මෙම අවස්ථාව අතිශයින් ප්‍රීතිමත් වූවකි. මේ ආ ගමන් මඟ දෙස අප ආපසු හැරී බලනුයේ ගවේෂණාත්මකව, කුතුහලයෙන් යුතුව දැනුම සතු අසීමිත බලය පිළිබඳව අප තැබූ විශ්වාසනීයත්වය ලද අසීමිත ජයග්‍රහණයක් ලෙස සලකමිනි.

ගෙවුනු දශක 5 ක ආයු කාලය තුළ අප සිදු කළේ ලිපි සංග්‍රහයන් ඔබට දායාද කිරීම පමණක් නොවේ. අදහස් හුවමාරු කරගන්නා වේදිකාවක් ලෙස විදුරාව සිය ඉඩකඩ හසුරවනු ලැබුවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, ගුරුවරුන්ට, දෙගුරුන්ට, විද්‍යාඥයන්ට මෙන්ම සමස්ත ජනප්‍රජාවට ප්‍රශ්න විසඳීමට, අවට ඇති ලෝකය නිරීක්ෂණය කරමින් ගවේෂණයට, විද්‍යාවේ ඇති අපූර්වත්වය විමර්ශනයට තෝතැන්නක් නිමිකරමිනි. විශ්වය තුළ සැඟවී ඇති අඛිරහස් වල සිට මේ මහ පොළොව මත පවත්නා ජීවයේ අපූර්වත්වය "විදුරාව" සිය කලාප තුළින් ඔබ වෙත ගෙන ආවේ සියළු විද්‍යා ක්ෂේත්‍රයන්ට පොදු ගැටළුව වූ "ඇයි?" යන සරල ප්‍රශ්නය මතු කරමිනි.

අප ඔබ හා එක්ව ගතකළ පසුගිය වසර 50ක කාලය තුළදී විද්‍යාව මහත් වෙනසකට ලක්වී ඇත, වෛද්‍ය ක්ෂේත්‍රය ලබා ඇති අසීමිත ප්‍රගතිය, අභ්‍යවකාශ ගවේෂණ ප්‍රතිඵල, පරිගණකයේ සම්ප්‍රාප්තිය, පරිසර විද්‍යාවේ පුළුල්වීම සහ තාක්ෂණයේ විජයග්‍රහණය අත්දැකීමට මෙම කාලය තුළදී අපට හැකිවිය. කිසිදා සිදු නොවිය යුතුයැයි සපථ කර තිබූ බොහෝ දෑ විවිධ සොයාගැනීම් හා නිපදවීම් හේතුකොට අපගේ ජීවිතවල අංග බවට පත්ව ඇත. එසේම ඒ අතර අපට අභියෝග ලෙස නව ක්ෂේත්‍ර රාශියක් ඉස්මතුවී ඇත. දේශගුණ විපර්යාස, ජෛව විවිධත්වය අහිමිවීම, කෘත්‍රිම බුද්ධියේ ආගමනය, නව රෝග ආසාදන මතුවීම මේ අභියෝග අතර ඉදිරියෙන්ම පවතින බව "විදුරාව" අවබෝධ කරගෙන සිටියි. විද්‍යාත්මක ප්‍රජාව මෙම අභියෝග හමුවේ උකටලී නොවිය යුතුය. විද්‍යාත්මක චින්තනය හා හැකියා භාවිත කරමින් පාසැල් පන්ති කාමර තුළදී මෙන්ම විද්‍යාගාර තුළදී ද මෙම අභියෝග පරයා යා හැකි ක්‍රමෝපායන් හෙළිදරව් කර ගැනීමට "විදුරාව" නොපැකිළ ඔබට උදවු වනු නොඅනුමානය. ගුරුවරුන් විශේෂයෙන්ම සිය ශිෂ්‍යයන් යොමු කළ යුත්තේ කුතුහලයෙන් පිරි ප්‍රශ්න විමසීමට, හේතු කාරණා සැක සහිත වුවත් ඒවා පරීක්ෂාවට ලක්කිරීමට, අදහස් පරීක්ෂාවට, වැරදීම් පිළිගනිමින් නිරවද්‍යතා සොයා යෑමට සහ අවට ලෝකයෙන් ලැබෙන තොරතුරු විවෘතව ළඟාකර ගැනීමට හැකි පෞරුෂයක් ගොඩ නංවා ගැනීමට පාසැලේදී ලැබෙන මෙම හැකියාවන්, යෞවනය හා තාරුණ්‍යය අඛ්බවා ජීවිත කාලය පුරාවටම සාර්ථක ජීවිතයකට අත්වැල් සපයනු නොඅනුමානය.

මේ එළැඹ ඇති අපගේ 50 වන සංවත්සරය එබැවින් අතීතය කරා යාමක් පමණක් නොව අනාගතය වෙත දෑස් දැල්වීමට කරන පෙරගමනක් ලෙසද දකිනු රිසිය. අනාගතයේදී විද්‍යාඥයන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, තාක්ෂණික විශේෂඥයන්, පර්යේෂකයන්, නව නිෂ්පාදකයන් සහ ව්‍යවසායකයන් වීමට කල්යල් බලන වර්තමාන ශිෂ්‍ය පරපුර මත ඊළඟ වසර 50 සතුවන ආශ්චර්යයක් නිගමනය කරනු ඇත. ඔවුන් නගන ප්‍රශ්න සහ මවන සිතිවිලි හා උපකල්පන අද අපට අනාවැකි කිව නොහැකි සොයා ගැනීම් වෙත නියතවම යොමු වනු ඇතැයි අපට පුරෝකථනය කළ හැකිය.

"විදුරාව" ඇරඹුණේ සහ පැවතුනේ ජාතික විද්‍යා පදනමේ ප්‍රකාශනයක් ලෙසය. එහෙත් එය පෝෂණය කරනු ලැබුයේ මෙරට සුවහසක් ශිෂ්‍යයන්, ගුරුවරුන්, විදුහල්පතිවරුන්, අධ්‍යාපනඥයන්, පර්යේෂකයන්, විද්‍යාඥයන් ඇතුළු දහස් සංඛ්‍යාත ලේඛක-පාඨක රැසකගේ සාමූහික ප්‍රයත්නයක් මතය. ඉදිරියටත් එය එසේ විය යුතු යැයි අප හඬගා කියමු.

වසර 50ක් අපට සාඩම්බර ඉතිහාසයක් උරුම කර ඇත. මීළඟ වසර 50 තුළ එය අමරණීය වනු ඇත්තේ අද අප ඇසීමට පවා බිය ප්‍රශ්නවලට පිළිතුරු සොයා යාම මතය. කුතුහලය, ගවේෂණය, සොයාගැනීම් සහ අපූර්වත්වය පදනම් වූ තවත් 50 වසරකට සුභාශිංසන!

තුසිත මලලසේකර